# අපේ පාසලට අපි ආදරෙයි




චිත්‍ර සහ කථාව :

**සිබිල් වෙත්තසිංහ**

සිංහල පරිවර්තනය - සුමිත්‍රා රාහුබද්ධ

© SDC – පළමු මුද්‍රණය - 2012

## අධ්‍යක්ෂකතුමාගේ පණිවුඩය

### සංවර්ධනය හා සහයෝගතාව පිළිබඳ ස්විස් නියෝජිතායතනය (SDC) ශ්‍රී ලංකාව

සංවර්ධනය හා සහයෝගතාව පිළිබඳ ස්විස් නියෝජිතායතනය, විදේශ කටයුතු පිළිබඳ ස්විට්සර්ලන්තයේ ෆෙඩරල් දෙපාර්තමේන්තුවෙහි ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයයි.

ස්ත්‍රීපුරුෂ භාවය, ආගම, දේශපාලන හෝ සමාජ පසුතලය ගැන නොසලකා, අවදානමට ලක්ව සිටින්නා වූ සහාය අවශ්‍ය වන අයට සහාය ලබාදීමට සංවර්ධනය සහ සහයෝගතාව පිළිබඳ ස්විස් නියෝජිතායතනයේ මානව හිතවාදී ආධාර වැඩපිළිවෙල බැඳී සිටියි. ව්‍යසනයකින් හෝ යුද්ධයකින් අනතුරුව දරුවන් සඳහා අධ්‍යාපනය අඛණ්ඩව ලබාදීමට සහාය ලබාදීම, සංවර්ධනය සහ සහයෝගතාව පිළිබඳ ස්විස් නියෝජිතායතනයේ වැදගත් ප්‍රමුඛතාවකි. එමෙන්ම, සංවර්ධනය සහ සහයෝගිතාව පිළිබඳ ස්විස් නියෝජිතායතනය විසින් සුනාමි ව්‍යසනයෙන් පසු පාසල් යළි ගොඩනැගීමට ද, උතුරු පළාතේ පාසල් යුද්ධයෙන් පසු අලුත්වැඩියා කිරීමට හා පුනරුත්ථාපනය කිරීමට ද සහාය දෙනු ලැබිණි.

එසේ පාසල් නැවත ගොඩනැගීමෙන් පසුව හා අලුත්වැඩියා කිරීමෙන් පසුව එම පාසල් හොඳින් පවත්වාගෙන යාම සහතික කිරීම ඉතාම වැදගත් කරුණකි. පාසලට අයත් දේපල හොඳින් නඩත්තු කිරීමේ වටිනාකම දරුවන්ට සිහිපත් කරදීම සඳහා මෙම ග්‍රන්ථය ඉගැනුම් මෙවලමක් ලෙස භාවිතා කිරීමට අපි ගුරුවරුන් හා දෙමාපියන් දිරිමත් කරවමු. මෙම කෘතිය මගින් ළමුන් සිය පාසලේ ගොඩනැගිලි සහ පහසුකම් ආරක්ෂා කිරීමට සහ ඒවාට ආදරය කිරීමට පොළඹවනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. එමගින් ඔවුන්ට මෙන්ම, ඔවුන්ගෙන් පසු පරම්පරාවන්හි දරුවන්ට ද, ප්‍රසන්න පරිසරයක ඉගෙනුම ලැබීමට සහ පාසල් ජීවිතය සතුටින් භුක්ති විඳීමට හැකියාව ලැබෙනු ඇත.

**පිලිප් බොයිට්ලර්.**
අධ්‍යක්ෂක,
ශ්‍රී ලංකාවේ ස්විස් සහයෝගිතා කාර්යාලය,
ශ්‍රී ලංකාව.

## ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ (පාසල් වැඩ අංශය) අධ්‍යක්ෂිකාවගේ පණිවිඩය

පාසලක භෞතික පහසුකම් අපගේ දරුවන්ගේ අධ්‍යාපනයෙහි වැදගත් කොටසක් ඉටු කරයි. පාසල් අලුත්වැඩියා කිරීම් හා පුනරුත්ථාපනය කිරීමට, හැම වසරකදීම විශාල මුදලක් වැය කරනු ලැබේ. මෙය ප්‍රධාන වශයෙන්ම පාසල් ගොඩනැගිලි සහ පහසුකම් සීඝ්‍රයෙන් හානියට පත්වීම නිසා සිදුවන්නකි. කුඩා ප්‍රමාණයේ අලුත්වැඩියා කිරීම් කලට වේලාවට නොකරන්නේ නම්, ඒවා කාලයත් සමගම විශාල අලුත්වැඩියා කිරීම් අවශ්‍යවන්නා වූ තත්ත්වයට පත්වෙයි. තම පාසල් පිරිසිදුවට හා පිළිවෙලට තබා ගැනීමට දරුවන් නිසි සැලකිල්ලක් නොදක්වන්නේ නම්, පාසල් ගොඩනැගිලි සහ ගෙවතු නොසලකා හරිනු ලැබූ තත්ත්වයට පත්වේ. පාසල් දේපල කැඩිබිඳී භාවිතා කළ නොහැකි තත්ත්වයට පත්වෙයි. හොඳින් නඩත්තු කරන පාසල් ඉගෙනීමට ප්‍රිය උපදවයි. එමෙන්ම, පාසල් හොඳින් නඩත්තු කරන්නේ නම්, අලුත්වැඩියා වියදම් අඩුකර ගැනීමට ද හැකිවෙයි. පාසල් ගොඩනැගිලි, දේපල හා පහසුකම් පිළිබඳ මනා සැලකිල්ලක් දැක්වීම හා ඒවා මනාව නඩත්තු කිරීම සම්බන්ධයෙන් ළමයින්ට, ගුරුවරුන්ට හා දෙමව්පියන්ට වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට ඇත. මෙම ග්‍රන්ථය සම්පාදනය කළේ මෙම පොත කියවන හැම ළමයෙක් තුළම තම පාසල කෙරෙහි ආදරයක් උපදවන බලාපොරොත්තුව සිත්හි දරාගෙනය. මේ කෘතිය සම්පාදනය කෙරෙන්නේ අද දවසේ දරුවන්ට සහ ඔවුන්ගෙන් පසු පරම්පරාවන් හි දරුවන්ට සිය ළමා කාලය සතුටින් ගත කළ හැකිවන පරිදි පාසල සුන්දර ස්ථානයක් බවට පත් කිරීමේ අදහසින් බව ද කිවමනාය.

**ඉංජිනේරු අයි.එම්. ප්‍රනාන්දු**
අධ්‍යක්ෂිකා (පාසල් වැඩ අංශය),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව.


මුළු ලෝකයේම සතුට වැඩියෙන් තියෙන තැනක් මා දැක්කා
මොකද මේ තරම් සතුටින් මේ උදේ?
මම මගේ ඥාති සහෝදරයාගෙ පාසල බලන්න ගියා


ඔවුන්, ඔවුන්ගෙ පාසල කොච්චර ලස්සනට තියාගෙන ඉන්නවද කියලා ඔයාලා දකින්න තිබුණේ !
මල් පිපිච්ච ගස් පිරිලා, පන්ති කාමර හරි පිරිසිදුයි. ඒවා අපූරුවට තියෙනවා. නිකන් අලුතින්ම හැදුවා වගේ !
ඉතින් ඔයා ඒවා දැකලා පිස්සු වැටුණද? අනේ දුප්පත් රාජු !


ඊළඟ දිනයේදී
මට හොඳ අදහසක් ආවා, ඔන්න අහගන්නකො
ඒ මොකද්ද ශ්‍රී රාම්?
ඉතින් කියන්නකො අපට


රාජු කිව්වා වගේ අපිත් අපේ ඉස්කෝලෙ ලස්සන තැනක් කරමු !
ඇත්තමයි, ප්‍රසන්න පරිසරයක අපිට හොඳට ඉගෙන ගන්න පුළුවන් කියලා මමත් හිතනවා


හුඟක් වැඩ කරන්න පුළුවන් වෙන්න අපි ඔක්කොටම කලින් කණ්ඩායම්වලට බෙදෙන්න ඕන
මොනවද ඒ වැඩ?
ඔය එක එක්කෙනාට පුළුවන්ද යෝජනා ඉදිරිපත් කරන්න ?
වත්තපිටිය අතුගාන්න
වැසිකිළි පිරිසිදු කරන්න
පන්ති කාමර පිරිසිදු කරන්න, ඒ වගේම පිළිවෙළට හරිගස්සන්න
කුණු කසල ඉවත් කරන්න
ඒ වගේම වැදගත්ම දේ තමයි ඔය ඔක්කොම වැඩ නිතිපතා කරන්න ඕන !


සර්, අපේ පාසල වඩා හොඳ තත්ත්වයකට ගේන්න අපිට ඕන කරනවා. අපි මේ ගැන කතාබහ කළා. ඔක්කොම කැමතියි මහන්සි වෙලා වැඩ කරන්න සර්
හොඳයි. පාසලේ විදුහල්පති හැටියට, මම සම්පූර්ණයෙන්ම අනුමත කරනවා ඔය දරුවන්ගෙ ව්‍යාපෘතිය. හොඳයි දරුවනේ එහෙම කරගෙන යන්න
සියලු දෙවියන්ගෙ පිහිටෙන් ඔවුන්ට ජයක්ම වෙන්න ඕන !


මේ වැඩ කරන්න ඕන පාසල් වෙලාවෙන් පස්සෙයි. ගෙදර ගිහින් හවසට පාසලට එන්න
අපි කණ්ඩායම් වලට බෙදිලා වැඩ කරන්න ඕන කියලා මං හිතනවා රාහුල්
මං හිතනවා අපි වැඩ මුරයක් හදන්න ඕන
ඔව් ඇත්තමයි, හැමෝම එකපාරට විඩාවට පත්වෙන්නේ නැති
අපි දහම් පාසල් නොගිහින් අරින්න හොඳ නෑ, ඒක හින්දා ඉරිදා අයින් කරන්න
මාත් එනවා උදව් කරන්න


මේ වැඩ මුරයෙ හැටියට 13 ශ්‍රේණියෙ අය, හැම සඳුදාම මුළු වත්තම අතුගාන්න ඕන, තේරුණාද?
අඟහරුවාදාට 12 වන ශ්‍රේණියේ ළමයි පන්ති කාමර පිරිසිදු කරන්න ඕන
ඔව්
වැඩමුරයෙ පිටපතක් හැම පන්ති කාමරයකම එල්ලන්න ඕන, හැමෝටම බලාගන්න
මට පැළ වලට වතුර දාන්න පුළුවන්
අපි වැඩ මුරයෙ හැටියට වැඩ කරනවා නම්, අපේ ඉස්කෝලෙ පිළිවෙළක් ඇති ලස්සන තැනක් බවට පත්වේවි
ඒවගේම, අපි හැමෝටම හොඳ ව්‍යායාමයක් !


අපිට පිරිසිදු කරන උපකරණ ඕන කරනවා. කොහෙන්ද කුමාර් ඒවා හොයාගන්නෙ ?
කොහොමද හොයාගන්නෙ කියලා හිතලා බලමු. යෝජනා එහෙම තියෙනවද?
නගරයෙ සාප්පු අයිතිකරුවන්ගෙන් අහලා බලමු
හොඳයි! අපූරුයි! උත්සාහ කරලා බලමු


පිට අයගෙන් උදව් ඉල්ලන්න කලින් විදුහල්පතිතුමාගෙ අවසරය ගත්තොත් හොඳයි
උදව් ඉල්ලන්න යනකොට සෙනසුරාදාවක් වුණත් පාසල් නිල ඇඳුම් ඇඳලා යන්න ඕන
හොඳ පිළිගැනීමක් ලැබෙන්නේ එතකොටයි


වනක්කම් මාමේ !
වනක්කම්!
සිංහම් ස්ටෝර්ස්.
මාමාගෙන් උදව්වක් ඉල්ලගන්නයි ආවෙ
අපේ පාසල ලස්සන තැනක් කරන්න අපි සැලසුම් කරනවා. ඒකට අපිට තීන්තත්, තව බඩු කිහිපයකුත් ඕන කරනවා
ෂා! ඒක අපූරු අදහසක්. හොඳ ලස්සනට තියාගෙන ඉන්න පාසලක් අපි හැමෝටම ආඩම්බරයක්. එන්න, මට කියන්න දරුවනේ ඔයගොල්ලන්ට මොනවද ඕන කියලා
හොඳ ආරම්භයක් !
අපි වාසනාවන්තයි!


සිරි සහ පුත්‍රයෝ.
ආයුබෝවන්, සුබ උදෑසනක් මාමේ !
ආයුබෝවන් ! මොකද මේ පාන්දරින්ම මාව බලන්න ආවෙ?
මාමේ, අපිට මාමගෙ උදව් ඕන
අපි අපේ පාසල හොඳ තත්ත්වෙකට ගේන්න වැඩ කරනවා. ඒකට අපිට තීන්ත ගාන බුරුසු, ඉදල්, රේක්ක, ඉණිමගක්, අලවංගුවක්, කොසු, වැසිකිලි පිරිසිදු කරන දේවල් ඕන කරනවා
ආ! ඒක බොහොම හොඳ අදහසක්. දරුවනේ, පාසල කියන්නෙ ඔගොල්ලන්ගෙ දෙවැනි නිවස. මට පුළුවන් විදිහට මං උදව් කරන්නම්. එන්න, ඔයාලට අවශ්‍ය දේවල් තෝරගන්න

# පාසල් වේලාවෙන් පසු


එක හවස්වරුවක දී අඩුතරමින් එකපැත්තක වල් පැලෑටි උදුරලා ඉවර කරන්න ලැබිච්ච එක කොච්චර හොඳද?
අපට අවශ්‍ය හැමදේම ලැබීම කොච්චර වාසනාවක්ද? රවි ඔයා එහෙම හිතන්නෙ නැද්ද?
ඇත්තෙන්ම හොඳ වැඩ වලට හොඳ ප්‍රතිඵල ලැබෙනවා !
අපි වගේ වාසනාවන්ත අය සම්බන්ධ වුණහම, හ්ම්!
ඔයා කිව්වා හරි දේවි!


සෙනසුරාදා
විදුහල්පති හැටියට, මගෙන් පුංචිම පුංචි දිරි ගැන්වීමක්වත් නැතිව මේ ළමයි ඇත්තටම හරියට මහන්සි වෙලා වැඩ කරනවා
ලොකු ළමයි, පොඩි ළමයින්ට ආදර්ශයක් දෙනවා. ඒ හැමෝම එකතුවෙලා මහන්සියෙන් වැඩ කරනවා


දෙන්න මට ඔය වැඩේ, ඔයා ටිකක් ගිමන් නිවාගන්න අබ්දුල්
මේ වැට හරියට ගහන්න අපට තව වැට ඉණියි ලණුයි ඕන කරනවා
පස්සෙ
බල්ලොයි බළල්ලුයි රිංගලා එන එක වළක්වන්න


අපේ කැඩිලා බිඳිලා ගිය වැසිකිලි ගැන මම මගේ තාත්තාට කිව්වා. තාත්තා ඒවා නොමිලයේම අලුත්වැඩියා කරලා දෙන්න පොරොන්දු වුණා
ප්‍රේමිලා, ඒවා අලුත්වැඩියා කළාට පස්සෙ ළමයි ඒවා නිවැරදිව පාවිච්චි කරන වද කියලා අපි සහතික කරන්න ඕන
කාන්තා වැසිකිලිය
සුමී, ඔයා වැසිකිලිය පාවිච්චි කළායින් පස්සේ දොර වැහුවද?
ඔව් !


සර්, අපට කුණුදාන්න භාජන ටිකක් හොයාගන්න පුළුවන්ද?
ඔව්, මං පළාත් කවුන්සලෙන් ඒවා ගන්න විදිහක් පිළියෙළ කරන්නම්
බොහොම ස්තුතියි සර් !


කොම්පෝස්ට්
වීදුරු
ප්ලාස්ටික්
හැම තැනම කුණු විසි කරන්නෙ කවුද කියලා බලන්න
නිවැරදි භාජන වලට, වෙනස් වර්ගවල කුණු දාන්න හැමදෙනාම ඉගෙන ගන්න ඕන
බලන්න වත්තෙන් මම කොච්චර කුණු එකතු කළාද කියලා !
ඒවා හැම තැනම විසි කරන්නෙ නැතුව


අපිට නගරයෙ කඩේට මේ පරණ පත්තර විකුණන්න පුළුවන්
ඒ සල්ලි පාසලේ කැටයට දාලා එකතු කරලා අපේ පාසලේ නඩත්තු වැඩවලට ගන්න පුළුවන්, එහෙම නේද?
හොඳ අදහස, එතකොට කාගෙන්වත් ආධාර ඉල්ලන්න ඕන නැහැනේ?


ඔක්කොම පන්ති කාමර වල තීන්ත ගාලා ඉවර කරන්න ගත වුණේ හරියටම හැන්දෑවරු හයයි. පිට බිත්ති ඔක්කොගෙම තීන්ත ගෑවෙ මාසුක් තමයි
හැමෝම අහගන්න. දැන් ඔක්කොම බිත්තිවල තීන්ත ගාලා ඉවරයි. ඊළඟට කරන්න තියෙන්නෙ හැමදේම හොඳට නඩත්තු කරන එක
අපි වැසිකිළි බිත්තිවල තීන්ත ගෑවා
බිත්තිවල ඇණ ගහලා තියෙන්න බෑ, තාප්පවල කොළ අලවන්න බෑ
පුෂ්පම් අක්කා, ඉස්කොලෙ ඇරුණට පස්සෙ, ගෙදර යන්න ඉස්සෙල්ලා පන්ති කාමර පිළිවෙළක් කරන්න ඕන
ඔව්, ඒක හොඳ අදහසක්
ඒ අදහසට චන්දුට සම්පූර්ණ ලකුණු හම්බවෙනවා


දරුවනේ, වතුර වැක්කෙරෙන කරාමයක්, හිරවෙච්ච කානු, කැඩිච්ච ජනේල, හිරවෙච්ච වැසිකිළි දැක්කොත්, විශේෂයෙන්ම විදුලි වයර් මතුවෙලා තියෙනවා දැක්කොත්, වහාම ඇවිත් මට කියන්න ඕන
ඔව් ගුරුතුමී, අපි එහෙම කරනවා


ගුරු නැන්දේ, අපේ ඕංචිල්ලාව කැඩිලා
මම ඊයෙ ඕංචිල්ලාවෙන් වැටුණා
මගේ තාත්තා කිව්වා ඒක හදලා දෙන්නම් කියලා


අපේ පාසල හොඳට පිළිවෙලට තියාගන්න මං උපදෙස් ලැයිස්තුවක් හැදුවා
ඔව් ගෝකුල් අයියා, අපි ඒක කියවලා ඒවා හොඳින් අනුගමනය කරනවා
හොඳයි


නිසාම්, ඔයා අපට කියන්න ඕන දැන්වීම් පුවරුවෙ මොනවද තියෙන්නෙ කියලා. ඒක හුඟක් උසින් තියෙන හින්දා අපට කියවන්න බෑ
ඔව්, ඇත්තෙන්ම මම බලලා කියන්නම් ඔයාලට ඒ නීති මොනවද කියලා
මාත් කැමතියි ඒ නීති මොනවද කියලා දැනගන්න
මං හිතනවා ඒවා ඉගෙන ගන්න ලේසි වෙයි

# දැන්වීම් පුවරුව

## අපගේ පාසල ලස්සන තැනක් කරගැනීම සඳහා කළ යුතු දේ

පාසල පිරිසිදුව හා පිළිවෙළට තබාගන්න.

බිත්තියේ කිසිවක් අලවන්න එපා, එයින් තීන්ත ගැලවී යාවි. හැකි අවස්ථාවලදී දැන්වීම් පුවරු භාවිතා කරන්න.

පාසල් භූමිය පිළිවෙළට තබාගන්න.

කුණු බිම දමන්න එපා, නිසි භාජන වලට දමන්න..

ප්ලාස්ටික් ෂොපිං මළු භාවිතය අඩුකරන්න. හැකි හැමවිටම බෑග් සහ බෝතල නැවත භාවිතා කරන්න.

ප්ලාස්ටික් හෝ පොලිතින්, කොම්පෝස්ට් දමන කුණු බඳුන් තුළට නොදමන්න.

පාවිච්චි නොකරන අවස්ථාවලදී විදුලි පංකා හා විදුලි පහන් නිවා දමන්න.



# දැන්වීම් පුවරුව

පාසලේ බිත්තිවල හෝ පාසලේ ගෘහ භාණ්ඩවල කිසිවක් නොලියන්න.

ඔබ වැසිකිළිය පාවිච්චි කළායින් පසුව වැසිකිළිය හොඳින් සෝදන්න.

ප්ලාස්ටික් බහාලුම්වල සහ ඉවත දැමූ ටයර්වල වතුර එකතු වන්නට ඉඩ නොදෙන්න. මදුරුවෝ බෝවෙන්න පුළුවන්.

පරිසරය ලස්සන කරන්න ඔබට පුළුවන් එළවළු, පළතුරු ගස්, තණකොළ සහ මල් ආදිය පාසල වටා වගා කරන්න.

**ඔබට දකින්නට වුවමනා කරන වෙනස ඔබ තුළම ඇති කරගන්න.**

**අදම පටන් ගන්න, එවිට අන් හැමදෙනාම ඔබව ආදර්ශයට ගනීවි.**




දැන් අපි එළවළු පාත්ති
පටන් ගන්න ඕන.
මේක බොහොම වැදගත්
ඒක හොඳයි,
මං බලාගෙනම
හිටියෙ එළවළු
වවන්න !
අපි හෙට පාසල
ඇරුණාහම පටන් ගනිමු


ඊළඟ දිනයේ පාසල නිමාවීමෙන් පසුව
ඔක්කොටම කලින් අපි
සම්පූර්ණයෙන්ම වල්
පැලෑටි උදුරලා ඉන්න ඕන
ඉස්සෙල්ලම
පැළ තවානෙ
එළවළු බීජ
තවන් දමන්න
ඕන
පැල
හිටවන්න
ඉස්සර
වෙලා
ඒ අතරතුර අපිට
පුළුවන් පොළව
කොටන්න


සති දෙකකට පසු . . .
පැළ හිටවන්න ඕන එකකට එකක් ඇතින් හිටින විදිහටයි
අපේ පාත්තියෙ හිටවන්නෙ බණ්ඩක්කා. ඒවා ඉක්මණට වැවෙනවා
හා නංගී, මං ඔයාට දෙන්නම් ටිකක් හිටවන්න
කරුණාකරලා, මටත් ඇට ටිකක් හිටවන්න දෙන්න අක්කා
මේ අපේ කුණු බාල්දිවලින් ගත්තු කොම්පෝස්ට් පෝර
මේ පෝර පැළ වලට


මාස දෙකකට පසුව
මේ පැල හොඳට වැවිලා තියෙනවා.
මං හදපු පඹයා ගැන ඔයා මොකද හිතන්නෙ?
එයා ඔයාගෙ බාග සහෝදරයා වගේ පේන්නෙ අක්බාර්
එයාට එහෙම විහිළු කරන්න එපා. එයා කරලා තියෙන්නෙ හොඳ වැඩක්, මීනා
ඔයාට මගේ සුබ පැතුම් සහෝදරයා. ඔයා හරි දක්ෂයා !


අපි මේ වතුර ටැංකිය ඊළඟ වැහි කාලය පටන්ගන්න කලින් පිරිසිදු කරන්න ඕනෑ
හොඳ අදහස !
අපි එහෙම කරමු අමීනා
මතකනේ ගිය අවුරුද්දෙ අපි ටැංකිය හරියට පිරිසිදු කළේ නෑ...
...ඉතින් වතුර පල්වෙලා තිබුණෙ
හෙට සෙනසුරාදා හින්දා අපි හෙට ටැංකිය සුද්ධ කරමු
අපි එන්න ඕන පරණ ඇඳුම් ඇඳගෙන. තෙමෙන්නයි, මඩ ගෑවෙන්නයි බලාගෙන එන්න ඕනෑ


පාසල හොඳින් තබා ගන්නවා කියන්නෙ ඔබේ දෙමව්පියන්ට හොඳින් සලකනවා වගේ දෙයක්. පාසල කියන්නෙ දරුවනේ අපේ දෙවැනි නිවසයි
පාසල පිරිසිදු සහ ප්‍රසන්න තැනක් වගේ තියාගන්න ඔයාලා හුඟාක් මහන්සි වෙලා වැඩ කරන එක ගැන මම ඇත්තෙන්ම සතුටු වෙනවා. ඒ වගේම ඔයාලගෙ අධ්‍යාපනයෙත් ලොකු වර්ධනයක් මම දකිනවා
ඔහොම හොඳ වැඩ ඉදිරියටම කරගෙන යන්න දරුවනේ


රමේෂ්, ඕනවට වැඩිය කපන්න එපා. වේලිච්ච අතු විතරක් කපන්න
මේ කප්පාදු කතුරෙන් කපන්න මං හරි ආසයි !
අහකට වෙන්න ශ්‍රීනා, ඔයාව තෙමෙයි
තුත්තිරි ගස් නිතිපතා උගුල්ලන්න ඕනෑ, ඒවා ඇගේ ඇලෙනවා
අබ්දුල් අයියේ, කරුණාකරලා පැල වලට වතුර දාන්න මටත් දෙන්නකෝ


අපිට අපේම කැන්ටිමක් ඉස්කෝලෙ තියෙන්න ඕන
හයි ස්ට්‍රීට් එකේ ඉන්න රහීම් මාමාගෙන් අහන්න ඕන එයා කැන්ටිමක් කරන්න කැමතිද කියලා
ඔය හැමදේකටම කලින් විදුහල්පතිතුමාගෙ අවසරය ගන්න ඕන
මං ගිහින් විදුහල්පතිතුමාගෙන් අවසර ඉල්ලගෙන එන්නද?
හොඳයි, එහෙනම් ගිහින් අහන්න


රහීම් පැන් ශාලාව
රහීම් මාමෙ, අපේ ඉස්කෝලෙ කැන්ටිමක් කරන්න මාමට පුළුවන්ද?
පුතා, මම මේ තේ කඩේ ඉන්න ඕන. ඒත් මගේ මල්ලිට පුළුවන් වෙයි මගෙ හිතේ
විදුහල්පතිතුමා අපිට අවසර දුන්නා ඔයාගෙන් අහන්න
මං මල්ලිගෙන් අහලා කියන්නම්


මැඩම්, අපේ ළමයි දැන් ඉස්කෝලෙ හොඳ ලස්සනට තියාගන්න ගොඩාක් උත්සාහ කරනවා. ඒගොල්ලො ඒකට හුඟාක් මහන්සි වෙනවා
ඔව්, විදුහල්පතිතුමයි, මුළු ගුරු මණ්ඩලයමයි, ළමයි ගැන බොහෝම සතුටින් ඉන්නෙ
ඒ වගේම තමයි ළමයින්ගෙ ඉගෙනීමෙත් ලොකු දියුණුවක් වෙලා තියෙනවා
මගේ පුංචි දැරිවි නිතරම කතා කරන්නෙ පාසලේ වැවෙන එළවළු ගැන
නවතින්න... නවතින්න... ඔච්චර හයියෙන් දුවන්න එපා
ගුරු නැන්දේ... ගුරු නැන්දේ...


සිවම්, මං කියන්න හිතාගෙනම හිටියේ පුතා, ඕගොල්ලන්ගෙ ඉස්කෝලෙ දැන් හරිම ලස්සනයි
ළමයිනුත් හරි පිළිවෙළයි කියලා පේනවා. පාසලේ අසල්වැසියො හැටියට ඒ විශාල දියුණුව ගැන අපිට හරි සතුටුයි
ඕන උදව්වක් ඉල්ලන්න පුතා, අපි ලෑස්තියි උදව් කරන්න
බොහොම ස්තූතියි මාමා, මාමා හරිම කරුණා වන්තයි


මාස තුනකට පසුව...
සර්, අපේ එළවළුයි, පලතුරුයි දැන් කඩන්න පුළුවන්. අපිට පුළුවන්ද සර් මේ සති අන්තයෙ දි පොළක් සංවිධානය කරන්න?
ඒක හොඳ ආරංචියක් මුතාලිබ්, එහෙනම් සංවිධානය කරන්න !
සර් අපිට පුළුවන්ද සිංහම් මාමටයි, සිරි මාමාටයි ආරධනා කරන්න අපේ පළමු ගැණුම්කාරයින් හැටියට ? මොකද අපිට ඕන කරන හැමදේම දීලා උදව් කළේ ඒ දෙන්නා
ඒක හොඳ ගුණාංගයක් දරුවනේ, උදව් කරපු කෙනෙකුට කළගුණ සලකන එක ලොකු දෙයක්. මට ඔයාලා ගැන ආඩම්බරයි ! ඒ ගොල්ලන්ට ආරාධනා කරන්න


වනක්කම් සිංහම් මාමා ! අපේ ඉස්කෝලෙ පොළට ආදරෙන් පිළිගන්නවා
වනක්කම් දුවේ !


ආයුබෝවන් සිරි මාමේ ! අපේ ඉස්කෝලෙ පොළට ආදරෙන් පිළිගන්නවා
ආයුබෝවන් දුවේ !
මටත් ආයුබෝවන් කියන්න.
මං මේ පත්තර මිටියම මිලදී ගන්නවා
හොඳයි


කොම්පෝස්ට් පෝර
මේ බණ්ඩක්කා හොඳයි වගේ. මට දෙනවද කිලෝ දෙකක් ?
මේ එළවළු අපිට හොඳයි, කාබනික පෝර විතරයිනේ දාලා තියෙන්නෙ
පුතාලා මේ පොළ නිතරම පවත්තන්න ඕන පුතේ
මේ ළමයි බොහොම හොඳයි
නැන්දට කොච්චර ගස්ලබු ඕනද?
ඉදිච්ච ගෙඩි දෙකක් ඇති
ගොටුකොළ මිටි දෙකක් දෙන්නද?
හොඳ වැඩක් !
හොඳයි.
පේර ඕනද නැන්දා?


පොළෙන් හොඳ ආදායමක්
ලැබුණා සර්
ඔව් මන්ජුඩ්, පුතාලගෙ පළමු
උත්සාහය ගැන මට සතුටුයි !
ඕගොල්ලො
වැඩේ හොඳට
කළා
දෙමව්පියො
කියනවා සර් ආයෙ
පොළ කරන්න
කියලා


අපි පාසලේ නඩත්තු
වැඩවලට ගන්න ඔය මුදල්
ඉතුරු කිරීමේ ගිනුමක දාමු
ඒක ලොකු
දෙයක් !
දිගටම අපි
මහන්සි වෙලා
වැඩ කරනවා
සර්


දරුවනේ, පාසල උසස් තත්ත්වයකට ගේන්න ඔයාලා හුඟාක්ම හොඳට වැඩ කළා...
...හැමෝම මහන්සි වෙලා වැඩ කරනවා අපි දැක්කා
මුළු ආචාර්ය මණ්ඩලයට ඔයාලා ගැන ආඩම්බරයි...
මේ උත්සාහය දිගට පවත්තගෙන යයි කියලා අපිට විශ්වාසයි


අරවින්ද විද්‍යාලය
දැන් ඉස්කෝලෙ මොන තරම් අපූරු තැනක්ද? හරි ලස්සනයි, පිරිසිදුයි
මෙතනට එන්න ආසා හිතෙනවා
දරුවො සන්තෝසෙන් තිබ්බම, ශක්තිමත් මතු පරපුරක් බිහිවෙනවා !

# පාසල් ගීතය



පාසල අපේ නිවහනයි
අපගේ දෙවැනි නිවහනයි
එකමුතු බලයෙන් පාසල බබළයි
සාමයෙ මල්දම් ඔබගෙයි අපගෙයි





දැනුමෙන් සපිරෙන ඉගෙනුම ලබමින
මතු දිවිමග අප පලබර කරමින
යහමඟ යන්නට හරිමග පෙන්වන
පාසල අපගේ සුරකිමු පණ මෙන





උවමි කරන්නට නමක් සොයන්නෙමු
දෙවැනි මවුන් යැයි ඔබට කියන්නෙමු
මතකයෙ මල්ගොමු අතර සරන්නෙමු
දිවි ඇතිතෙක් අපි සිරස නමන්නෙමු

ඔවා දී අදරින අප සැදු මාතා
දොහොත් මුදුන් දී නමදිමු මාතා
අප යහමග යවනා අපගේ මාතා
රකිමුව දිවි ඇතිතුරු පාසල් මාතා

